NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 09 ශ්‍රේණිය | බුද්ධ ධර්මය | 13 ඒකකය |
|---|---|---|

## වැවයි දාගැබයි ගමයි පන්සලයි

## I කොටස

- **සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. ශ්‍රී ලාංකික සමාජයේ සංස්කෘතික නවෝදයක් ඇතිවීමට පදනම් වූ ඓතිහාසික සිදුවීම කුමක්ද?
    (1). විජයාගමනය
    (2). බුදුරදුන්ගේ ලංකාගමනය
    (3). දුමින්දාගමනය
    (4). මහින්දාගමනය

02. අතීත ශ්‍රී ලංකාවේ ජීවනෝපායන් අතර මූලිකත්වය ගත් රැකියාව වන්නේ,
    (1). කෘෂිකර්මාන්තයයි
    (2). සත්ත්ව පාලනයයි
    (3). විවිධ කර්මාන්තයි
    (4). වෙළඳාමයි

03. අතීතයේ මෙරට පරිපාලනමය බෙදීම්වලට අනුව තුන් සිංහලය නමින් හඳුන්වනු ලබුවේ,
    (1). රුහුණු, පිහිටි, මායා රට
    (2). මලය, උතුර, දකුණු රට
    (3). අටදහස් රට, දොළාස්දහස් රට, තුන්දහස් රට
    (4). රජරට, දකුණු රට, පිහිටි රට

04. ආර්ථික හා ආධ්‍යාත්මික උභයාර්ථ සංවර්ධනයේ මූලික සංකේතය වන්නේ,
    (1). ගමයි - පන්සලයි සංකල්පය
    (2). වැවයි - දාගැබයි සංකල්පය
    (3). පාසලයි - පන්සලයි සංකල්පය
    (4). පාසලයි - පොලීසියයි සංකල්පය

05. මැටි පස් භාවිතා කරමින් ගඩොල් තනා මුතුන්මිත්තන් විසින් නිර්මාණය කරන ලද වාස්තුවිද්‍යාත්මක නිර්මාණය වන්නේ,
    (1). පොකුණුය
    (2). පිළිම වහන්සේලාය
    (3). වටදාගෙවල්ය
    (4). මහ දාගැබ් වහන්සේලාය

06. මහ වැව් අමුණු ඉදිකරවීමේ මූලික අරමුණ කුමක්ද?
    (1). රට තුළ ඇති ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීමයි
    (2). සදාචාරාත්මක සහ ආධ්‍යාත්මික දියුණුව ඇතිකිරීමයි
    (3). කය වෙහෙසා වැඩ කරන නීරෝගී ජනතාවක් ඇති කිරීමයි
    (4). පූජා සංවර්ධනයේ පදනම වන ආර්ථික සංවර්ධනය ඇති කිරීමයි

07. බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු තැම්පත් කර ගොඩනැගූ පූජනීය ස්ථාන වන්නේ,
    (1). දාගම පිහිටි ස්ථානය
    (2). බෝධිසර ස්ථානය
    (3). ප්‍රතිපිළිම පිහිටි ස්ථානය
    (4). දේවාල පිහිටි ස්ථානය

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!
agaram.lk

08. අනුරාධපුර යුගයේ වැවක් නොවන්නේ,

(1). තිසා වැව (2). නුවර වැව (3). බසවක්කුලම වැව (4). පරාක්‍රම සමුද්‍රය

09. අනුරාධපුර යුගයට අයිති නොවන දාගැබක් වන්නේ,

(1). රුවන්වැලි සෑය
(2). ථූපාරාම දාගැබ
(3). මිරිසවැටි දාගැබ
(4). රන්කොත් වෙහෙර

10. වාපි සංස්කෘතිය තුළ ධාර්මික රැකියාවක් වන්නේ,

(1). ආයුධ වෙළඳාම
(2). සත්ත්ව වෙළඳාම
(3). වසවිස වෙළඳාම
(4). කෘෂිකර්මාන්තය

## II කොටස

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. I. බෞද්ධ මුහුණුවරක් ප්‍රකට කෙරෙන ජනප්‍රිය ව්‍යවහාර සංකල්පය කුමක්ද?
II. එම සංකල්පය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.
III. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් පැහැදිලි කරන්න.

02. I. විධිමත් වූ වාස්තුවිද්‍යාත්මක වශයෙන් ඉහළ අගයක් ගන්නා වූ නිර්මාණ දෙක නම් කරන්න.
II. වැවක අංග නම් කරන්න.
III. වාපි සංස්කෘතිය තුළ වැව් ඉදිකිරීමේදී පුරෝගාමීව ක්‍රියා කළ පුද්ගලයින් කවුරුන්ද?

03. I. ගමයි පන්සලයි අතර සබඳතාවය උපමා කර ඇත්තේ කුමකටද?
II. වැවයි දාගැබයි නිර්මාණය කිරීමේදී ඇති සබඳතාවය කුමක්ද?
III. දාගැබ් නිර්මාණය කිරීමෙන් පැරැන්නෝ බලාපොරොත්තු වූයේ කුමක්ද?

04. I. අනුරාධපුර යුගයට අයත් වැව් තුනක් නම් කරන්න.
II. අනුරාධපුර යුගයට අයත් දාගැබ් තුනක් නම් කරන්න.
III. අතීත මුතුන්මිත්තන් සමගියෙන් සහජීවනයෙන් ක්‍රියාකළ අවස්ථා පිළිබඳ විස්තර කරන්න.

05. I. ලාංකික ජනතාවගේ සාරධර්ම 04ක් නම් කරන්න.
II. අධාර්මික රැකියාවන් හතරක් ලියන්න.
III. අතීත මුතුන්මිත්තන්ගේ ජීවන තොරතුරු මගින් අපට ගත හැකි ආදර්ශ මොනවාද?

Agaram.l - Keep your dreams alive!
Agaram.l - Keep your dreams alive!